**ශීර්ෂය - 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **මතය**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 16 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාවිසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමණාකරනය**

**2.1.1 ප්‍රතිපාදන මාරු කිරීම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල වැය විෂයයන් 07 ක ප්‍රතිපාදන මු.රෙ. 66 - 69 ප්‍රතිපාදන යටතේ සියයට 03 සිට 53 දක්වා අඩු කිරීම්ද, වැය විෂයයන් 09 ක ප්‍රතිපාදන සියයට 08 සිට සියයට 133 දක්වා වැඩි කිරීම්ද සිදුකර තිබුණි. | 2020 වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් සඳහා වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදනවලින් ඉතිරිවීම් වේ යැයි අපේක්ෂා කළ වැය විෂයන් මඟින් මු.රෙ. 66 - වීරමොං ක්‍රියාපටිපාටිය යටතේ, මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන මාරු කර 2020 වර්ෂය සඳහා 245 වැය ශීර්ෂය යටතේ වෙන් වූ ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනය කළ අතර, එක් එක් වැය විෂයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමට බලපෑ හේතු මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 2 (iii) ආකෘතිය යටතේ ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වනු කැමැත්තෙමි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්විකව හා ඵලදායී ලෙස සකස් කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදි වැය විෂයයන් 02 ක් සඳහා අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන් කර ගෙන නොතිබුණද, වර්ෂය තුල මු.රෙ. 66 මාරු කිරීම් වීරමොං ක්‍රියාපටිපාටිය යටතේ රු. 1,441,400 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන නව වැය විෂයයන් ඇති කර ගෙන තිබුණි. | මු.රෙ. 66 විධිවිධාන යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත 245-01-01-00-1701 - පාඩු හා කපා හැරීම් වැය විෂය සඳහා ප්‍රතිපාදන මාරු කර ගත් බව හා දෙපාර්තමේන්තුව සතු WP NA – 2700 දරණ වෑන් රථය අදාළ කාල සීමාවන්වල දී අළුත්වැඩියාවක් සිදු කළ යුතු වූ අතර, ඒ සඳහා ප්‍රතිපාදන නොමැති වූ බැවින් මු.රෙ. 66 - වීරමොං ක්‍රියාපටිපාටිය යටතේ මූල්‍ය ප්‍රතිපාදන මාරු කර ගනිමින් අදාළ අළුත්වැඩියාව 2020 වර්ෂය තුළ සිදු කළ බව කාරුණිකව දන්වමි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්විකව හා ඵලදායී ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ අවශ්‍යතාවය |

**2.2** **බැරකම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 94 (i) හා අංක 01/2014 හා 2014 ජනවාරි 01 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයේ 6.4 වගන්තිය ප්‍රකාරව බැදීම් ඇතිකර ගැනීමට ප්‍රථම ඒ සඳහා අදාල වැය විෂයයන් තුල ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කරගත යුතු වුවද, එවැනි තහවුරුවකින් තොරව වැය විෂයයන් 04 ක් සඳහා රු. 160,222 ක බැරකම් වලට බැඳී තිබුණි. තවද, එකතුව රු. 201,087 ක් වූ බැරකම්, මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් පිළිබද ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාළව නිළධාරීන්ගේ ගමන් වියදම්, 1/3 දීමනා, අතිකාල දීමනා සහ 1/20 දීමනා මෙන්ම දුරකථන බිල්පත් සහ වෙනත් බාහිර ආයතන මගින් එවා ඇති බිල්පත් ගිණුම් අංශය වෙත ලැබී ඇති අනුපිළිවෙලින් අදාළ ප්‍රතිපාදන සීමාව තුළ, *CIGAS* පද්ධතියේ බැරකම් ලෙස ඇතුළත් කර ඇත. | මු.රෙ. වලට අනුකූලව කටයුතු කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම් සිදුකිරීම |

| | | |
|---|---|---|
| | 2020.12.31 දිනට පැවති ඉතිරි ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට එළඹ නොමැති අතර , 2020 වර්ෂයට අදාළව 2021 වර්ෂය තුළ ලද වවුචර්පත් සඳහා මු.රෙ.115 (2) හා (3) හි විධිවිධාන ප්‍රකාරව, 2021 වර්ෂය සඳහා අනුමත වූ ප්‍රතිපාදන භාවිතා කරමින් 2021 ජනවාරි හා පෙබරවාරි මාසවල ගෙවා ඇති බව කාරුණිකව දන්වනු කැමැත්තෙමි. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්ය සාධන වාර්තාව ඇතුලත් කර යාවත්කාලීන කල යුතු වුවද, විගණිත දිනය වූ 2021 මැයි 10 වන විට 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පමණක් ඇතුලත් කර තිබූ බව නිරීක්ෂණය විය. | කොවිඩ් 19 අවධානම් තත්වය හේතුවෙන් 2020 වර්ෂයේ මුදල් මුල් කාර්තුවේ සිට දෙපාර්තමේන්තුවේ දෛනික කටයුතු පවත්වාගෙන යනු ලබන්නේද සීමිත කාර්යය මණ්ඩලයක් සේවයට කැඳවමිනි. එහෙයින් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සිදු කිරීමට පියවර ගනිමින් ඇති බව කාරුණිකව දන්වමි. | වෙබ් අඩවිය නිසි පරිදි යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**4.1** **අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) **අනුයුක්ත කාර්යමණ්ඩලය හා සත්‍ය කාර්යමණ්ඩලය** | | |
| i. දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව වූ තනතුරු 78 ක් තනතුරු 12 ක පුරප්පාඩුව පැවතීම නිසා එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 15 ක් වී තිබුණු අතර, මෙම පුරප්පාඩු තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂක/සහකාර අධ්‍යක්ෂ යනාදී තනතුරු 11 ක් ද පැවතුණි. | මුදල් අමාත්‍යාංශය මගින් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සම්බන්ධව 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කළ නව සංවිධාන ව්‍යුහයට අදාල කාර්යමණ්ඩල සම්බන්ධ ස්ථාන මාරුවීම් ක්‍රියාවලිය සම්පූර්ණ වූ පසුව මෙම ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම |